# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1650/31 - 2010 අප්‍රේල් 23 වැනි සිකුරාදා - 2010.04.23**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**බස්නාහිර පළාතේ පළාත් සභාව**

බස්නාහිර පළාතේ 2010 අංක 02 දරණ මුදල් (සංශෝධන ) ප්‍රඥප්තිය

බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල් ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන, පළාත් පරිපාලන, විදුලිබල හා බලශක්ති, මිනිස්බල හා රැකී රක්ෂා සහ ආර්ථික ප්‍රවර්ධන අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මම, බස්නාහිර පළාතේ 2010 අංක 02 දරණ මුදල් ( සංශෝධන ) ප්‍රඥප්තිය සඳහා බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමාගේ අනුඥාව ලද 2010.03.08 වැනි දින සිට, එම මුදල් (සංශෝධන ) ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන බව මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ප්‍රසන්න රණතුංග,
බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල් ක්‍රම සම්පාදන,
නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන, පළාත් පරිපාලන, විදුලිබල හා
බල ශක්ති, මිනිස්බල හා රැකී රක්ෂා සහ ආර්ථික ප්‍රවර්ධන අමාත්‍ය.

2010 අප්‍රේල් මස 16 වැනි දින,
කොළඹ 07,
ශ්‍රාවස්ති මන්දිරය,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

**බස්නාහිර පළාතේ 2010 අංක 02 දරණ මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය**

***2009 අංක 02 දරණ ප්‍රඥප්තියෙන් සංශෝධිත 1990 අංක 06 දරණ බස්නාහිර පළාතේ මුදල් ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සඳහා වූ ප්‍රඥප්තියකි***

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය.

01. මෙම ප්‍රඥප්තිය බස්නාහිර පළාතේ 2010 අංක 02 දරණ මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, ආණ්ඩුකාරවරයාගේ අනුමතය ලැබීමෙන් පසු ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක සිට එය ක්‍රියාත්මක විය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 3 (2) උප වගන්තිය සංශෝධනය කිරීම.

02. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 (2) උප වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(2) මේ පරිච්ඡේදයේ කාර්ය සඳහා "ව්‍යාපාරය" යන්නෙන්, යම් භාණ්ඩයක් තොග වශයෙන් නැතහොත් සිල්ලරට විකිණීම අදහස් වන නමුත්, නිෂ්පාදකයකු විසින් ඔහු නිෂ්පාදනය කළ භාණ්ඩ කිසිවක් විකිණීම ඊට අයත් නොවේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වැනි වගන්තිය සංශෝධනය කිරීම.

03. 2009 අංක 2 දරණ ප්‍රඥප්තියෙන් සංශෝධිත 1990 අංක 06 දරණ බස්නාහිර පළාතේ මුදල් ප්‍රඥප්තියේ 11 වන වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

පිරිවැටුම් බද්ද ගෙවීම.

11. (1) යම් කාර්තුවක් සම්බන්ධයෙන් වූ පිරිවැටුම් බද්ද ඒ කාර්තුව අවසානවීමෙන් පසුව එළඹෙන මාසයේ පහළොස් වැනි දින පසුවීමට පෙර ගෙවිය යුතුය. එසේ වුවද, යම් ව්‍යාපාරයක පූර්ව කාර්තුව සඳහා වූ පිරිවැටුම රුපියල් මිලියන දහයක් ඉක්මවන අවස්ථාවකදී තදනන්තර කාර්තුව සඳහා ගෙවිය යුතු පිරිවැටුම් බද්ද පහත දැක්වෙන ආකාරයෙන් ගෙවනු ලැබිය යුතු ය :–

(අ) පූර්වයෙන් වූ කාර්තුව සඳහා ගෙවිය යුතු පිරිවැටුම් බද්දෙන් තුනෙන් එකකට සමාන මුදලක්, තදනන්තර කාර්තුවේ දෙවන මාසයේ පහළොස්වන දින හෝ ඊට පෙර ද ;

(ආ) පූර්වයෙන් වූ කාර්තුව සඳහා ගෙවිය යුතු පිරිවැටුම් බද්දෙන් තවත් තුනෙන් එකකට සමාන මුදලක්, තදනන්තර කාර්තුවේ තුන්වන මාසයේ පහළොස්වන දින හෝ ඊට පෙර ද ;

(ඇ) නියමිත කාර්තුව සඳහා ගෙවිය යුතු පිරිවැටුම් බද්දේ ඉතිරි කොටස, එම කාර්තුව අවසාන වීමෙන් පසුව එළඹෙන ප්‍රථම මාසයේ පහළොස්වන දින හෝ ඊට පෙර ද
ගෙවිය යුතුය ;

එසේ නොගෙවන ලද යම් බද්දක් ගෙවීම පැහැර හරින ලද බද්දක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ බද්ද ගෙවනු ලැබිය යුත්තේ යම් තැනැත්තකු විසින් හෝ යම් ආයතනයක් විසින් වන කල්හි ඒ තැනැත්තා හෝ ඒ ආයතනය විසින් ද, යම් බද්දක් එක් තැනැත්තකුට වැඩි දෙනෙකු විසින් හෝ හවුල් ව්‍යාපාරයක් විසින් හෝ ගෙවිය යුතුව ඇති අවස්ථාවක ඒ තැනැත්තාගෙන් එක් එක් තැනැත්තා සහ හවුල් ව්‍යාපාරයේ එක් එක් හවුල්කරු විසින් ද මේ ප්‍රඥප්තියේ කාර්යය සඳහා ගෙවීම පැහැර හරින ලද තැනැත්තකු ලෙස සලකනු ලැබිය යුතු ය.

විකිණීම සඳහා යම් තැනැත්තකුට හෝ ආයතනයකට පවරනු ලබන භාණ්ඩ වෙනුවෙන් රඳවා ගැනීමේ පිරිවැටුම් බද්දක් අය කිරීම.

(2) මේ ප්‍රඥප්තියේ කුමක් සඳහන්ව තිබුණ ද යම් ආනයනකරුවකු, නිෂ්පාදකයකු හෝ විකුණුම්කරුවකු විසින් යම් භාණ්ඩයක් විකිණීම සඳහා යම් තැනැත්තකුට හෝ ආයතනයකට පවරනු ලබන අවස්ථාවක, ඒ පැවරීම මත එළඹුණු ගණුදෙනුව වෙනුවෙන් ලැබුණු හෝ ලබා ගැනීමට නියමිත මුදල් ප්‍රමාණයෙන් එම භාණ්ඩය සඳහා 7 (1) උප වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් කලින් කලට ගැසට් නිවේදනයක් මගින් නියම කරනු ලබන පිරිවැටුම් බදු අනුප්‍රමාණය මත ආගණනය කරන ලද පිරිවැටුම් බද්දට සමාන මුදලක් රඳවා ගැනීමේ පිරිවැටුම් බද්දක් ලෙස අයකර ගත යුතු ය.

ලියාපදිංචි කිරීම

(3) (අ) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දින හෝ ඉන් පසුව හෝ රඳවා ගැනීමේ පිරිවැටුම් බද්දක් අය කරනු ලැබිය හැකි ගණුදෙනුවක් කරන සෑම තැනැත්තකු හෝ ආයතනයක් ම මේ ප්‍රඥප්තියේ විධිවිධානවලට යටත්ව මේ ප්‍රඥප්තියේ විධාන කර ඇති අන්දමට ලියාපදිංචි විය යුතු ය.

(ආ) (අ) ඡේදය යටතේ ලියාපදිංචි විය යුතු සෑම තැනැත්තකු හෝ ආයතනයක් ම ලියාපදිංචි කරනු ලැබීමට යටත් වූ දින සිට දින 30ක් ඇතුළත ලියාපදිංචි වීම සඳහා වූ ඉල්ලීමක් කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(ඇ) (අ) ඡේදය යටතේ ලියාපදිංචි කිරීමේ කාර්යය සඳහා බදු අය කළ හැකි ගණුදෙනුවලට අදාළව තොරතුරු කොමසාරිස්වරයා විසින් කවර හෝ අවස්ථාවක ඉල්ලා සිටිය හැක.

(ඈ) (අ) ඡේදය යටතේ ලියාපදිංචි විය යුතු සෑම තැනැත්තෙකු හෝ ආයතනයක්ම (ආ) ඡේදය යටතේ කොමසාරිස්වරයා වෙත ලියාපදිංචිවීම සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබූ විට හෝ එම තැනැත්තා හෝ ආයතනය (අ) ඡේදය යටතේ ලියාපදිංචි විය යුතු බවට කොමසාරිස්වරයා තීරණය කරන්නේ නම් හෝ එම තැනැත්තා හෝ ආයතනය කොමසාරිස්වරයා විසින් ලියාපදිංචි කරනු ලැබිය යුතු ය. කොමසාරිස්වරයා විසින් යම් තැනැත්තකු හෝ ආයතනයක් ලියාපදිංචි කරනු ලැබීමෙන් පසු ;

(i) ලියාපදිංචි කිරීමේ අංකයක් ; සහ

(ii) ලියාපදිංචි කිරීමේ සහතිකයක් ;

ඒ තැනැත්තා හෝ ආයතනය වෙත නිකුත් කළ යුතු ය.

(ඉ) සෑම ලියාපදිංචි තැනැත්තකු හෝ ආයතනයක් විසින් :-

(i) එම තැනැත්තා හෝ ආයතනය විසින් කරගෙන යනු ලබන ව්‍යාපාර නාමයෙහි, ව්‍යාපාරය පිහිටි ස්ථානයෙහි හෝ එහි ලිපිනයෙහි ; හෝ

(ii) එම තැනැත්තා හෝ ආයතනය විසින් නිකුත් කරනු ලබන හෝ කරගෙන යනු ලබන, බදු අය කළ හැකි ගණුදෙනු ස්වභාවයේ, හිමිකමේ හෝ අයිතියේ ; හෝ

යම් වෙනසක් සිදුවූ විට, එම වෙනස්කම සිදුවී දින 14 ක් ඇතුළත කොමසාරිස්වරයා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

(4) (අ) (2) උප වගන්තියේ විධිවිධාන අනුව රඳවා ගැනීමේ පිරිවැටුම් බද්ද අයකර ගන්නා සෑම ආනයනකරුවකු, නිෂ්පාදකයකු හෝ විකුණුම්කරුවකු විසින් යම් භාණ්ඩයක් විකිණීම සඳහා පවරනු ලබන අවස්ථාවක ඒ ගණුදෙනුව සම්බන්ධයෙන් ;

රඳවා ගැනීමේ පිරිවැටුම් බද්දක් අය කොට වවුචරයක් නිකුත් කිරීම.

(i) ගණුදෙනුවට එළඹුනු දිනය, ස්ථානය හා භාණ්ඩවල වර්ගය ;

(ii) එළඹුනු ගණුදෙනුවේ වටිනාකම ;

(iii) එම තැනැත්තාගේ හෝ ආයතනයේ නම හා ලිපිනය ;

සහ

(iv) ඒ ගණුදෙණුවට ආරෝපණය කළ හැකි රඳවා ගැනීමේ පිරිවැටුම් බද්ද ;

දක්වමින් කොමසාරිස්වරයාට ද පිටපතක් සහිතව භාණ්ඩ පැවරීම සිදු කරනු ලැබූ තැනැත්තාට හෝ ආයතනයට වවුචරයක් නිකුත් කළ යුතුය.

(ආ) (2) උප වගන්තියේ විධිවිධාන අනුව යම් ආනයනකරුවකු, නිෂ්පාදකයෙකු හෝ විකුණුම්කරුවකු විසින් රඳවා ගැනීමේ පිරිවැටුම් බද්දක් අයකර ගනු ලැබූ විට එම පිරිවැටුම් බද්ද අයකර ගැනීමට යෙදුනේ කවර ගණුදෙණුවක් වෙනුවෙන් ද, එම ගණුදෙණුව සිදු වූ කාර්තුව සඳහා රඳවාගත් පිරිවැටුම් බදු මුදල, එම රඳවා ගත් දින සිට දින 14ක් ඇතුළත කොමසාරිස්වරයා නියම කරන ලද ආකෘති පත්‍රයට අනුව (අ) ඡේදය යටතේ නිකුත් කළ යුතු වවුචරයේ පිටපත ද සහිතව කොමසාරිස්වරයා වෙත ප්‍රේෂණය කළ යුතු ය.

කොමසාරිස්වරයා වෙත ප්‍රේෂණය කිරීම.

(ඇ) පිරිවැටුම් බද්දට යටත් යම් තැනැත්තකුගේ හෝ ආයතනයක යම් කාර්තුවක පිරිවැටුමෙහි මීන් පෙර විධිවිධාන සලසා ඇති පරිදි රඳවා ගැනීමේ පිරිවැටුම් බද්ද අය කර ගන්නා ලද යම් භාණ්ඩයක් විකිණීමෙන් ලබාගන්නා ලද හෝ ලැබිය යුතු මුදල් ප්‍රමාණයක් ඇතුළත් වන අවස්ථාවක, (2) වන උප වගන්තිය යටතේ රඳවා ගැනීමේ පිරිවැටුම් බද්දක් ගෙවා ඇති බවට (අ) ඡේදය යටතේ නිකුත් කරන ලද වවුචරය කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කිරීම මත එකී කාර්තුව සඳහා ගෙවිය යුතු පිරිවැටුම් බද්දෙන් ඒ වවුචරයේ රඳවා ගැනීමේ පිරිවැටුම් බද්ද ලෙස දක්වා ඇති මුදල අඩු කර ගැනීමට හෝ ගෙවිය යුතු හිඟ පිරිවැටුම් බද්දක් සඳහා හිලව් කිරීමට එම තැනැත්තාට හෝ ආයතනයට හිමිකම ඇත්තේ ය.

පිරිවැටුම්බද්දට හිලව් කිරීම හෝ අඩු කිරීම.

(5) බස්නාහිර පළාත තුළ සිදු වූ යම් ගණුදෙණුවක් සම්බන්ධයෙන් ගිවිසුමට එළඹියේ මේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීමට පෙර වුව ද, නොවුව ද යම් තැනැත්තකු හෝ ආයතනයක් විසින් තමා පාර්ශ්වයක්ව සිටින්නා වූ ගිවිසුමක් ප්‍රකාර හෝ ගිවිසුමකට පාර්ශ්වයක් වන්නා වූ වෙනත් යම් තැනැත්තකු හෝ ආයතනයක් වෙනුවෙන් ඒ ගිවිසුම ප්‍රකාර යම් ගෙවීමක් කරන ලද අවස්ථාවක 7 (1) උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් කලින් කලට නියම කරනු ලබන බදු අනුප්‍රමාණය මත ආගණනය කරන ලද පිරිවැටුම් බද්දට සමාන මුදලක් රඳවාගැනීමේ පිරිවැටුම් බද්දක් ලෙස ඒ ගෙවීම කරන සෑම තැනැත්තකු හෝ ආයතනයක් විසින්ම එම මුදල් ගෙවීමේ දී අඩුකර ගනු ලැබිය යුතු ය. එසේ වුව ද ඒ ගිවිසුම ඉටු කිරීමෙහිලා ගෙවිය යුතු මුළු ප්‍රතිෂ්ඨාව රුපියල් පනස් දහස නොඉක්මවන්නේ නම් එවැනි අඩු කිරීමක් නොකළ යුතුය.

ගිවිසුම්ගත ගෙවීම්වලින් පිරිවැටුම් බදු අඩුකිරීම.

අඩු කල පිරිවැටුම් බද්ද පිළිබඳව සහතිකයක් කොමසාරිස්වරයා වෙත එවිය යුතු බව.

(6) (අ) (5) උප වගන්තියේ විධිවිධාන අනුව රඳවාගැනීමේ පිරිවැටුම් බද්ද අඩුකර ගනු ලබන අවස්ථාවේදී එම මුදල සම්බන්ධයෙන් ;

(i) ගෙවීම කරන ලද්දේ යම් තැනැත්තෙකුට හෝ ආයතනයකට ද ඒ තැනැත්තාගේ හෝ ආයතනයේ නම සහ ලිපිනය ;

(ii) එසේ ගෙවන ලද මුදල් ප්‍රමාණය ;

(iii) අඩුකර ගන්නා ලද බදු අනු ප්‍රමාණය සහ බදු මුදල් ප්‍රමාණය ;

(iv) නියම වශයෙන් ගෙවන ලද ශුද්ධ මුදල ;

දක්වමින්, එම පිරිවැටුම් බද්ද අඩුකර ගනු ලබන්නා වූ යම් තැනැත්තකු හෝ ආයතනයක් විසින් එම අඩු කරගනු ලැබීම සිදු කරන ලද්දේ යම් තැනැත්තකුට හෝ ආයතනයක් වෙත සිදු කරන ලද ගෙවීමකින් ද, එම තැනැත්තා හෝ ආයතනය වෙත කොමසාරිස්වරයාට ද පිටපතක් සහිතව සහතිකයක් නිකුත් කළ යුතුයි.

ගිවිසුම්ගත ගෙවීම් වලින් පිරිවැටුම් බද්ද කොමසාරිස්වරයා වෙත ප්‍රේෂණය කිරීම.

(ආ) (5) උප වගන්තියේ විධිවිධාන අනුව රඳවාගැනීමේ පිරිවැටුම් බදු අඩුකර ගනු ලැබූ යම් තැනැත්තකු හෝ ආයතනයක් විසින් රඳවාගැනීමේ පිරිවැටුම් බද්ද අඩුකර ගැනීමට යෙදුනේ කවර ගණුදෙණුවක් වෙනුවෙන් ද, එම ගණුදෙණුව වෙනුවෙන් රඳවා ගත් පිරිවැටුම් බදු මුදල, එම රඳවා ගත් දින සිට දින 14ක් ඇතුළත කොමසාරිස්වරයා විසින් නියම කරන ලද ආකෘති පත්‍රයට අනුව (අ) ඡේදය යටතේ නිකුත් කළ යුතු සහතිකයේ පිටපත ද සහිතව කොමසාරිස්වරයා වෙත ප්‍රේෂණය කළ යුතුය.

ගිවිසුම්ගත ගෙවීම් වලින් පිරිවැටුම් බද්දට හිලව් කිරීම හෝ අඩු කිරීම.

(ඇ) පිරිවැටුම් බද්දට යටත් යම් තැනැත්තකුගේ හෝ ආයතනයක, යම් කාර්තුවක් සඳහා පිරිවැටුම මත අය කළ හැකි බද්දෙහි මින් පෙර විධිවිධාන සලසා ඇති පරිදි ගිවිසුම්ගත ගෙවීම් වලින් රඳවා ගැනීමේ පිරිවැටුම් බද්ද ලෙස අඩුකර ගන්නා ලද මුදල් ප්‍රමාණයක් ඇතුලත් වන අවස්ථාවක, (5) උපවගන්තිය යටතේ රඳවා ගැනීමේ පිරිවැටුම් බද්ද අඩුකර ඇති බවට, (අ) ඡේදය යටතේ නිකුත් කරන ලද සහතිකය කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කිරීම මත, එකී කාර්තුව සඳහා ගෙවිය යුතු පිරිවැටුම් බද්දෙන් ඒ සහතිකයේ රඳවා ගැනීමේ පිරිවැටුම් බද්ද ලෙස දක්වා ඇති මුදල අඩු කර ගැනීමට හෝ ගෙවිය යුතු හිඟ පිරිවැටුම් බද්දක් සඳහා හිලව් කිරීමට එම තැනැත්තාට හෝ ආයතනයට හිමිකම ඇත්තේ ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ ඇතැම් විධිවිධාන අනුගත කර ගත හැකි බව.

(7) එක් එක් කාර්තුවකදී පිරිවැටුම දැක්වෙන වාර්තා සැපයීමට, බදු ගෙවීමට, පිරිවැටුම් බද්දක් අය කර ගැනීමට, ගෙවීම් පැහැර හැරීමේ දී නෛතික ක්‍රියාමාර්ග ගැනීමට, දණ්ඩන පැනවීමට සහ පිරිවැටුම් බදු ආපසු ගෙවීමට අදාල මේ ප්‍රඥප්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, මේ වගන්තිය යටතේ රඳවා ගැනීමේ පිරිවැටුම් බද්දට අදාලව හෝ ඒ පිළිබඳ වාර්තා සැපයීමට, බදු ගෙවීමට, බද්දක් අය කර ගැනීමට ගෙවීම් පැහැර හැරීමේ දී නෛතික ක්‍රියාමාර්ග ගැනීමට, දණ්ඩන පැනවීමට සහ පිරිවැටුම් බදු ආපසු ගෙවීමට ද ඒ ආකාරයෙන්ම අදාල විය යුතු ය.

11 වැනි වගන්තිය සඳහා අර්ථ නිරූපනය.

(8) (අ) (5) උප වගන්තියේ කාර්ය සඳහා "ගිවිසුම" යන්නෙන් ;

(i) කවර වූ හෝ ස්වභාවයක භාණ්ඩ සැපයීම සම්බන්ධයෙන් වූ ගිවිසුමක් ද ;

(ii) (i) අනු ඡේදයේ සඳහන් යම් ගිවිසුමක් සම්බන්ධයෙන් වූ අනු ගිවිසුමක් ද ;

අදහස් වේ.

එසේ වුවත්, සේවා සපයන්නෙකු විසින් තම සේවා සැපයීම සඳහා එළඹෙන්නා වූ ගිවිසුමක්, මෙම වගන්තියේ කාර්ය සඳහා ගිවිසුමක් ලෙස අර්ථ නොදැක්විය යුතු ය.

(ආ) මේ වගන්තියේ කාර්ය සඳහා "ආනයනකරුවකු" යන්නෙන් යම් භාණ්ඩයක් විදේශයකින් ආනයනය කර, විකිණීම සඳහා යම් තැනැත්තකුට හෝ ආයතනයකට පවරනු ලබන තැනැත්තකු හෝ ආයතනයක් අදහස් වේ.

(ඇ) මේ වගන්තියේ කාර්ය සඳහා "නිෂ්පාදකයකු " යන්නෙන් ඔහු නිෂ්පාදනය කළ භාණ්ඩ කිසිවක් විකිණීම සඳහා යම් තැනැත්තකුට හෝ ආයතනයකට පවරනු ලබන තැනැත්තකු හෝ ආයතනයක් අදහස් වේ.

(ඈ) මේ වගන්තියේ කාර්ය සඳහා "විකුණුම්කරුවකු " යන්නෙන් විකිණීම සඳහා භාණ්ඩ පවරා ගනු ලබන තැනැත්තකු හෝ ආයතනයක් අදහස් වේ.

(ඉ) මේ වගන්තියේ කාර්ය සඳහා "පැවරීම" යන්නෙන් යම් ආනයනකරුවකු නිෂ්පාදකයකු නොවන තැනැත්තකුට හෝ ආයතනයකට භාණ්ඩ ලබාදීම හෝ යම් නිෂ්පාදකයකු, විකිණීම සඳහා යම් තැනැත්තකුට හෝ ආයතනයකට භාණ්ඩ ලබාදීම හෝ විකුණුම්කරුවකු, විකිණීම සඳහා යම් තැනැත්තකුට හෝ ආයතනයකට භාණ්ඩ ලබාදීම අදහස් වේ.

04. ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වැනි වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :– ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය සංශෝධනය කිරීම.

16. යම් තැනැත්තකු හෝ ආයතනයක් විසින් 10 වැනි වගන්තිය යටතේ යම් කාර්තුවක් සඳහා සපයන ලද වාර්තාවක් තක්සේරුකරු විසින් පිළිනොගෙන ඒ තැනැත්තා හෝ ආයතනය සම්බන්ධයෙන් ඒ කාර්තුව සඳහා 13 වැනි වගන්තිය හෝ 14 වැනි වගන්තිය යටතේ තක්සේරුවක් හෝ අතිරේක තස්සේරුවක් කරනු ලබන අවස්ථාවක තක්සේරුකරු විසින් ඒ වාර්තාව පිළිගනු නොලබන්නේ මන්ද යන වග ඒ තැනැත්තාට හෝ ආයතනයට ලියාපදිංචි කරන ලද ලිපියක් මගින් දැන්විය යුතු ය. වාර්තාවක් පිළිනොගන්නේ මන්ද යන්න තක්සේරුකරු විසින් දැනුම් දිය යුතු බව.

05. ප්‍රධාන ප්‍රඥප්තියේ 34 (අ) උප වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උප වගන්තිය ආදේශ කිරීමෙන් එම උප වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 34 (අ) උපවගන්තිය සංශෝධනය කිරීම.

(අ) 10 වැනි වගන්තියෙහි, 11 වැනි වගන්තියෙහි, 30 වැනි වගන්තියෙහි, හෝ 31 වැනි වගන්තියෙහි විධිවිධාන අනුව ක්‍රියා කිරීම පැහැර හරින්නා වූ ; හෝ

06. 2009 අංක 2 දරණ ප්‍රඥප්තියෙන් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 85 (2) උප වගන්තිය ඉවත් කර ඒ වෙනුවට, පහත දැක්වෙන උප වගන්තිය ආදේශ කිරීමෙන් එම උපවගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 85 (2) උපවගන්තිය සංශෝධනය කිරීම.

(2) 4 වැනි වගන්තිය යටතේ වූ හෝ 11 (1) උප වගන්තියේ (අ), (ආ) සහ (ඇ) ඡේද යටතේ වූ හෝ 13 වැනි වගන්තිය යටතේ වූ හෝ 14 වැනි වගන්තිය යටතේ වූ හෝ 57 (1) උප වගන්තියේ (ආ) ඡේදය යටතේ වූ හෝ 98 (5) උප වගන්තියේ (අ) ඡේදය යටතේ වූ හෝ යම් දැන්වීමක් මගින් ගෙවීමට නියමිත බදු මුදල ඒ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනයට පෙර ගෙවිය යුතු අතර, එසේ නොගෙවන ලද බද්දක් පැහැර හරිනු ලැබූ ලෙස සළකනු ලැබිය යුතු ය.

07. 2009 අංක 2 දරන ප්‍රඥප්තියෙන් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 87 (2) උප වගන්තිය ඉවත් කර ඒ වෙනුවට, පහත දැක්වෙන උප වගන්තිය ආදේශ කිරීමෙන් එම උප වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 87 (2) උපවගන්තිය සංශෝධනය කිරීම.

(2) පැහැර හැර ඇති තැනැත්තා විසින් 11 (1) උප වගන්තියේ (අ), (ආ) සහ (ඇ) ඡේද යටතේ වූ හෝ 13 වැනි වගන්තිය යටතේ වූ හෝ 14 වැනි වගන්තිය යටතේ වූ හෝ 57 (1) උප වගන්තියේ (ආ) ඡේදය යටතේ වූ හෝ 98 (5) උප වගන්තියේ (අ) ඡේදය යටතේ වූ හෝ යම් තක්සේරුවකට හෝ දැන්වීමකට විරුද්ධව නිසි කාලසීමාව ඇතුළත අභියාචනයක් කරනු ලැබ නොමැති නම් මේ වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ නිකුත් කරන ලද දැන්වීමේ දිනයෙහි සිට දින තිහක් ඇතුළත දී එසේ නියම කරනු ලැබූ බද්ද පිළිබඳව යම් විරෝධතාවයක් ඔහු විසින් ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර, කොමසාරිස්වරයා විසින් ඒ විරෝධතා සළකා බලා ඒ පිළිබඳව තම තිරණය දිය යුතු ය. එවිට එම තීරණය අවසානාත්මක වන්නේ ය.

08. 2009 අංක 2 දරන ප්‍රඥප්තියෙන් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 87 (3) උප වගන්තිය ඉවත් කර ඒ වෙනුවට, පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් එම උපවගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 87 (3) උපවගන්තිය සංශෝධනය කිරීම.

(3) මේ වගන්තියේ කුමක් සඳහන්ව තිබුණ ද, 11 (1) උප වගන්තියේ (අ), (ආ) සහ (ඇ) ඡේද යටතේ වූ හෝ 13 වැනි වගන්තිය යටතේ වූ හෝ 14 වැනි වගන්තිය යටතේ වූ හෝ 57 (1) උප වගන්තියේ (ආ) ඡේදය යටතේ වූ හෝ 98 (5) උපවගන්තියේ (අ) ඡේදය යටතේ වූ හෝ යම් දැන්වීමකට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කර ඇත්තාවූ ද, ඒ දැන්වීමේ සඳහන් යම් බද්දක් ගෙවීම කොමසාරිස්වරයාගේ නියමයක් අනුව අත්හිටුවා ඇත්තා වූ ද, ඒ අභියාචනය විභාග කරනු ලබන අතරතුර ඒ දැන්වීම සම්බන්ධයෙන් ගාස්තු වශයෙන් යම් මුදලක් අය විය යුතු බවට, හෝ අයවීමට ඉඩ ඇති බවට අභියාචක එකඟවන්නා වූ ද, අවස්ථාවක, කොමසාරිස්වරයා විසින් අභියාචකට ලියවිල්ලකින් දෙනු ලබන දැන්වීමක් මගින්, ඒ දැන්වීමේ සඳහන් කරනු ලබන යම් දිනයක හෝ එදිනට පෙර දිනයක, ඒ මුදල ගෙවන ලෙස අභියාචකට නියම කරනු ලැබිය හැකි ය.

09. ප්‍රධාන ප්‍රඥප්තියේ 102 වගන්තියේ (1) සහ (2) උපවගන්ති ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උප වගන්ති ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

ප්‍රධාන ප්‍රඥප්තියේ 102 (1) හා (2) උපවගන්ති සංශෝධනය කිරීම.

නිල රහස්‍යතාව.

(1) මේ ප්‍රඥප්තිය යටතේ ස්වකීය කාර්යය ඉටු කිරීමෙහි ලා හැර මේ ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා හෝ ක්‍රියාත්මක කිරීමෙහිලා යම් තැනැත්තකුට සහාය වීම සඳහා හෝ සේවයෙහි නියුක්ත කරවනු ලැබ සිටින හෝ ලැබ සිටි සෑම තැනැත්තකුම, ප්‍රඥප්තිය යටතේ ස්වකීය කාර්ය ඉටු කිරීමෙහි දී යම් තැනැත්තකුගේ කටයුතු පිළිබඳව තමාට දැන ගැනීමට ලැබෙන සියළු කාරණා සම්බන්ධයෙන් රහස්‍යතාව ආරක්ෂා කිරීම හා ආරක්ෂා කිරීමෙහි ලා සහාය වීම කළ යුතු ය. තවද ඒ කාරණය අදාළ වන්නේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තාට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයාට හෝ අමාත්‍යවරයාට හෝ මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයාට හෝ මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නිසියාකාරව බලය දෙනු ලැබූ නිලධාරියකුට හැර යම් තැනැත්තකුට එවැනි යම් කාරණයක් නොදැන්විය යුතු අතර කොමසාරිස්වරයාගේ සන්තකයෙහි, භාරයෙහි හෝ පාලනයෙහි ඇති ලේඛන කිසිවක් ලබා ගැනීමට යම් තැනැත්තකුට ඉඩ හැරීම හෝ අවසර දීම හෝ නොකළ යුතු ය.

(2) මේ ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා සේවයෙහි නියුක්ත කරවනු ලැබූ සෑම තැනැත්තකු විසින් මේ ප්‍රඥප්තිය යටතේ ක්‍රියා කිරීමට පෙර සාමදාන විනිශ්චයකාරවරයකු හෝ දිවුරුම් කොමසාරිස්වරයකු ඉදිරිපිට දී නියමිත ආකෘතියෙහි වූ රහස්‍යතාවය පිළිබඳ දිවුරුමක් දී අත්සන් කළ යුතු අතර, අමාත්‍යවරයා විසින් හෝ මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් හෝ මුදල් අමාත්‍යාංශයේ ලේකම් විසින් නිසියාකාරව බලය පවරන ලද නිලධාරියකු විසින් හෝ මේ ප්‍රඥප්තිය යටතේ ක්‍රියා කිරීමට පෙර, සාමදාන විනිශ්චයකාරවරයකු හෝ දිවුරුම් කොමාසාරිස්වරයකු ඉදිරිපිට දී නියමිත ආකෘතියෙහි රහස්‍යතාව පිළිබඳ දිවුරුමක් දී ඊට අත්සන් කළ යුතු ය.

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 102 (5) උප වගන්තියට ඉක්බිතිව පහත දැක්වෙන අලුත් උප වගන්තිය ඇතුළත් කිරීමෙන් එම වගන්තිය මෙසේ සංශෝධනය කරනු ලැබේ. :–

(6) මේ වගන්තියේ කුමක් සඳහන් වුව ද, යම් තැනැත්තකු හෝ ආයතනයක් විසින් කරගෙන යනු ලබන යම් ව්‍යාපාරයක, තොග හෝ සිල්ලර වෙළඳාමට ඇතුළත් පිරිවැටුම් සම්බන්ධයෙන් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාට අවශ්‍ය යම් කාරණයක් පිළිබඳව, ආදායම් කොමසාරිස්වරයා විසින් අවශ්‍යයයි සලකන ප්‍රමාණයට දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාට ඒ තොරතුරු ලබාදිය හැකි ය.

අර්ථ නිරූපණය

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 106 වැනි වගන්තියේ "වටිනාකම" යන අර්ථකථනයට ඉක්බිතිව පහත දැක්වෙන අලුත් අර්ථකථන ඇතුළත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

*මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා –*

"පිරිවැටුම් බද්ද " යන්නෙන් 3 (1) වගන්තිය යටතේ ආගණනය කරන ලද බද්දක් අදහස් කරනු ලබන අතර, එයට 11 වැනි වගන්තිය යටතේ අය කරනු ලබන රඳවා ගැනීමේ පිරිවැටුම් බද්ද ද ඇතුළත් වේ.

"නිෂ්පාදකයා " යන්නෙන් යම් භාණ්ඩයක් සාදන හෝ රසායනික ක්‍රියාවකින් හෝ අන්‍යාකාරයකින් යම් භාණ්ඩයක සංයුතිය හෝ ස්වරූපය මුළුමනින් ම වෙනස් කරන තැනැත්තා අදහස් වේ.

"භාණ්ඩය " යන්නෙන් යම් බඩු, ද්‍රව්‍ය, කෘෂිකාර්මික හෝ උද්‍යාන නිෂ්පාදන ඇතුළත් වේ.

"මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා " යන්නෙන් බස්නාහිර පළාත් සභාවේ මුදල් විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා අදහස් වේ.

102 (1) හා (2) උප වගන්තිවල කාර්ය සඳහා "නිසියාකාරව බලය දෙනු ලැබූ නිලධාරියා" යන්නෙන් මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ලිඛිතව බලය පවරන ලද ප්‍රස්තුත විෂයට අදාළ නිපුණත්වයක් ඇති රාජ්‍ය නිලධාරියකු අදහස් වේ.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

12. මෙම ප්‍රඥප්තියේ සිංහල, දෙමළ සහ ඉංග්‍රිසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

05-137

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.